# විසර්ජන ශීර්ෂය - 265, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම

# විගණකාධිපති වාර්තාව- 2012

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

i. පහත දැක්වෙන සේවා සැපයීම තුළින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනය පහල ස්ථරය දක්වා ගෙනඒම.

   (අ) ජාතික හැඳුනුම්පත් සම්බන්ධ සේවාවන්

   (ආ) චරිත සහතික හා අවිවාහක සහතික නිකුත් කිරීම

   (ඇ) කාර්ය සැලැස්ම සම්බන්ධ ක්‍රියාකාරකම්

   (ඈ) ආගමික හා සදාචාර වර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා පහසුකම් සැපයීම.

ii. ගිණුම් තැබීම, වාර්තාකරණය හා වත්කම් ආරක්ෂාව ඇතුළු මූල්‍ය කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකිරීම

iii. විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු කාර්යක්ෂම කිරීම.

iv. රජයේ අරමුදල් හා විදේශ අරමුදල් යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

v. ගොවීන්ගෙන් වී මිලදී ගැනීම් සඳහා වී අත්තිකාරම් ලබා දීම.

vi. ආපදා කළමනාකරණ ක්‍රියාවලින්

vii. උප්පැන්න , මරණ , විවාහ සහතික නිකුත්කිරීම හා ඉඩම් ලියාපදිංචි කිරීමේ කටයුතු

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) මන්නාරම

(ආ) නානාටන්

(ඇ) මුසාලී

(ඈ) මාන්තයි බටහිර

(ඉ) මඩු

## 1.2 විගණන විෂය පථය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ

කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජනගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදී හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවු ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණයන්

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව, මෙම වාර්තාවේ (අ) සිට (ඈ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ 1.6 සිට 1.13 දක්වා වු ජේද වල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ වලින් ඇතිවන බලපෑම හැර මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) පොත්පත් හා ලේඛන පවත්වා නොතිබීම

(i). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛනවර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක , උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002 / 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 (1) |

(ii). බිල්පත්, වැඩ අවසන් කිරීමේ වාර්තා ප්‍රතිසම්පාදන ලියකියවිලි ආදී අවශ්‍ය සාක්ෂි නොමැතිවීම නිසා රු. 511,244 ක් වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු එකොළහක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) **විසර්ජන ගිණුම**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.152,303,686 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.146,849,558 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ඉතිරි කිරීම් රු.5,454,128 ක් එනම් 3.58 ක ප්‍රතිශතයක් විය. විසතර පහත දැක්වේ.

| වියදම් | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 113,700,000 | 129,453,686 | 127,661,615 | 1,792,071 | 1.38 |
| මූලධන | 22,850,000 | 22,850,000 | 19,187,943 | 3,662,057 | 16.0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| එකතුව | **136,550,000** | **152,303,686** | **146,849,558** | **5,454,128** | **3.58** |

(ii) **අයවැය විචලනය**

වැය විෂයන් 07 ක් සඳහා රු.2,167,928 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එම වැය විෂය යටතේ වූ ඉතිරිය සියයට 27 ත් 88 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.විස්තර පහත දැක්වේ.

| වැය විෂය | ශුද්ධ ප්‍රතිපාදන | ශුද්ධ වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 265-1-1-1203 | 100,000 | 60,855 | 39,145 | 39 |
| 265-1-1-1401 | 10,000 | 4,800 | 5,200 | 52 |
| 265-1-1-1404 | 50,000 | 5,712 | 44,288 | 88 |
| 265-1-1-1405 | 530,000 | 345,707 | 184,293 | 35 |
| 265-1-1-2002 | 750,000 | 546,943 | 203,057 | 27 |
| 265-1-1-2003 | 1,500,000 | 448,895 | 1,051,105 | 70 |
| 265-1-1-2103 | 1,000,000 | 359,160 | 640,840 | 64 |
| | 3,940,000 | 1,772,072 | 2,167,928 | |

(iii) අවස්ථා 13 කදී රුපියල් 537,371 ක් වූ පුනරාවර්තන වියදම් වැරදි ලෙස වර්ගීකරණය කර විවිධ මූලධන වැය විෂයක් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(iv) **රාජ්‍ය වියදම් කළමනාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ලබා දුන් පුනරාවර්තන වැය වලින් සියයට 02 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතුව තිබූ නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුනරාවර්තන වියදමින් සියයට 1.38 ක් පමණක් ඉතිරි කර තිබුණි.

(v) **ඉන්ධන සහ විදුලි වියදම් කළමනාකරණය**

2012 පෙබරවාරි 16 දිනැතිඅංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි, ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ලේඛනය මගින් කරන ලද ප්‍රතිපාදන සීමාව

---

තුල වියදම් කළමනාකරණය කළ යුතුය.භාණ්ඩාගාරයෙන් අමතර මුදල් ලබා නොගත යුතු අතර මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීමටද භාණ්ඩාගාරය විසින් අනුමත නොකළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන සඳහා රු. 2,900,000 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණි.

**(vi) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 18 ක් හා දෙපාර්තමේන්තු 09 ක් විසින් පිළිවෙලින් රු.146,000,678 කින් සහ රු. 293,994,281 කින් සමන්විත එකතුව රු.439,994,959 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර එයින් පිළිවෙලින් රු. 112,513,057 කින් සහ රු. 249,603,945 කින් සමන්විත රු.362,117,002 ක මුදලක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. 77,877,957 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්, විෂය අංක 26501 යටතේ පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 9,500,000 | 8,382,608 | 6,500,000 | 8,030,902 | 49,000,000 | 36,902,576 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් එකතුව රු.244,593 ක ණය ශේෂයන් හිඟ හිට තිබූ නමුත් එම ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

---

(ii) සේවාය නවතා තිබූ නිලධාරියෙකුගෙන් හිඟ හිට තිබූ රු.31,305 ක ණය ශේෂය 2012 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි.

(iii) තනතුර හැර ගිය නිලධාරියෙකුගෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ රු.80,459 ක හිඟ ණය ශේෂය මෙම වාර්තාවේ දින දක්වා අයකර ගෙන නොතිබුණි.මෙම ණය ශේෂය වැරදි ලෙස දෙපාර්තමේන්තුවේ සේවාවේ නිරත වී සිටින නිලධාරියෙකුගෙන් අයවිය යුතු මුදල් ලෙස රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ පෙන්නුම් කර තිබුණි.

(iv) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ණය පාලන ගිණුම් ශේෂය රු.5,062,239 ක් වුවද කේවල ශේෂ ලේඛණ එකතුව රු.4,982,783 ක් වූ අතර රු.79,456 ක් වූ වෙනස සැසඳුම් කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.62,026,091 වූ අතර විස්තර පහත දැක්වේ.

| **ගිණුම්අංකය** | **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6003/0/0/41 | 62,026,091 |

මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) එකතුව රු.835,479 ක් වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල් ව්‍යාපෘතියේ ශේෂය අදාළ ආයතනයට ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ii) ශ්‍රී ලංකා ඉඩම් නිරවුල් හා සංවර්ධන සංස්ථාව විසින් ලබා දුන් රු.2,158,000 ක අරමුදල් අදාළ කාර්යයන් සඳහා යොදවා නොගෙන 2009 සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**1.6 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**1.6.1 සංයුක්ත සැලැස්ම**

සයළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත්සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත්පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.6.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරණ ජාතික අයවැය චක්‍රෙල්ඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.6.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

භාණ්ඩාගාර ලේකම්ගේ 2009 ජූනි 12 දිනැති අංක අයිඒඅයි/2000/01 දරන *චක්‍රලේඛය* ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් හෝ පැවැත්විය යුතු වුවත් එවැනි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂයේ පවත්වා නොතිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **වත්කම් වර්ගය** | **ඒකක සංඛ්‍යාව** | **නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය** |
|---|---|---|
| (i) ආපනශාලා ගොඩනැගිල්ල | 01 | වර්ෂ 2 |
| (ii)එප්සන් ප්‍රොජෙක්ටරය | 01 | වර්ෂ 1 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්විය යුතු වුවත් සමීක්ෂණ මණ්ඩල වාර්තා 2013 මාර්තු 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මන්නාරම, මාන්තායි බටහිර සහ මුසාලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි 2011 සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ හඳුනාගෙන තිබූ ප්‍රයෝජනයට ගත නොහැකි ගබඩා අයිතම් කාණ්ඩ 33 ක්, 12 ක්, සහ 16 ක් සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්ෂ 1 කට අඩු බේරුම් නොකළ බැරකම් රු. 515,804 ක් විය.

## 1.8 අනුකූල නොවීම්

**නීති ,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණන නියැදි පරක්ෂණවලදී නිරක්ෂණය වු නීති ,රීති , හා රෙගුලාසි වල විධිවිධානයන්ට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතුය.කෙසේ වුවද මුසාලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වසර 02 කට වැඩි කාලයක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) 2012 ජනවාරි 16 දිනැති අංක 2012/01 දරන ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ 5.6 වගන්තිය | නැවුම් කිරි වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා සහකාර ප්‍රාදේශීය ලේකම්/සහකාර අධ්‍යක්ෂ සැලසුම් වෙත ප්‍රාදේශීය ලේකම් රාජකාරි පැවරිය යුතු වුවත් එවැනි අධීක්ෂණ වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.<br><br>නැවුම් කිරිවල තත්වය මහජන සෞඛ්‍යය පරීක්ෂක සහ පශු වෛද්‍ය විසින් නිරන්තරයෙන් පරීක්ෂා කල යුතු වුවත් මෙම අවශ්‍යතාවය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළිපැද නොතිබුණි. |

1.9 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා</u>

<u>ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්</u>

දිස්ත්‍රික් ලේකම් විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම් (වාර්තා අනුව) | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|
| | රු. | රු | |
| මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මහජන ඉදි කිරීම. | 400,000 | 349,277 | අධික වර්ෂාව සහ ගංවතුර තත්ත්වය |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 මාර්තු 13 වැනි දින කරන ලද භෞතික පරීක්ෂණයේදී රු.202,618 ක් වටිනා වැඩ 2013 මාර්තු 13 දක්වා නිමකර නොතිබීම නිරීක්ෂණය විය.

(ii) ගිවිසුම් දිනය, නිමකළ යුතු දිනය සහ ප්‍රමාද ගාස්තු ගිවිසුමේ සඳහන් කර නොතිබුණි.

### 1.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළ යුතු ශේෂ**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන වල දැක්වුනු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

**කාල විශ්ලේෂණය**

| ගැලපුම් පිළිබඳ විස්තරය | මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් | 43,934 | 13,048 | 56,982 |

### 1.11 අවිධිමත් ගනුදෙනු

ගෙවීම් ලියකියවිලි සහ අනෙකුත් සම්බන්ධිත ලියකියවිලි අනුව විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ නඩ්ඩාන්කන්ඩල් ග්‍රාම සංවර්ධන සමිතියට රු.242,500 ක් වටිනා ජංගම වානේ තාවකාලික කුටි ලබාදී තිබුණු නමුත් 2013 මාර්තු 13 සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී නඩ්ඩාන්කන්ඩල් ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ජංගම කුටි ලැබී නොතිබුණි.

### 1.12 ආර්ථික නොවූ ගනුදෙනු

වර්ෂ කිහිපයක් සඳහා වූ ජල බිල්පත් නිරවුල් කිරීමේදී ප්‍රමාද සිදුවීම නිසා ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට රු.25,088 ක් අධිභාරයක් ලෙස ගෙවා තිබුණි.

### 1:13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 15 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 31 | 16 | 15 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 316 | 211 | 105 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 53 | 36 | 17 | - |
| (v) | වෙනත් (අනියම්) | 0- | 04 | - | 04 |
| | එකතුව | 421 | 282 | 143 | 04 |